
# පටුන


1. හැඳින්වීම
2. දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර
3. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්
4. දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය
5. අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු සහ අතිරික්ත
6. 2016 අයවැය ඇස්තමේන්තුව
7. දෙපාර්තමේන්තුවේ අංශ සහ ව්‍යුහය
8. 2016 වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය
9. අභියෝග සහ අනෙකුත් බාධාවන්
10. කාර්ය සාධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා ගත යුතු පියවර


# 1. හැඳින්වීම

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තුවක් වශයෙන් 1849 වර්ෂයේ කොළඹ ගෑස් වීදියේ ආරම්භ කරන ලද රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පසු කාලීනව එනම් 1928 වර්ෂයේ සිට කොලොන්නාව දෙමටගොඩ මාර්ගයේ ඛණිජ තෙල් සංකීර්ණය අසල පිහිටුවා ඇත.




**රජයේ කර්මාන්තශාලාව විසින් ඉදි කරන ලද පාලම්**

ආරම්භක කාල සීමාවේදී මහා මාර්ග, පාලම්, වාරි මාර්ග, ගොඩනැගිලි ඉදිකිරීම් යනාදී යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වී ඇති අතර විදේශීය ඉංජිනේරුවන් විසින් මෙම ආයතනය මෙහෙයවා ඇත.




රජයේ කර්මාන්තශාලාව විසින් ඉදි කරන ලද ප්‍රදීපාගාරයක්

1969 දක්වා මෙලෙස ක්‍රියාත්මක වූ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව එමගින් ඉටු කළ මහා මාර්ග තැනීම, නඩත්තුව, සහ ගොඩනැගිලි ඉදි කිරීම සහ නඩත්තුව යනාදී සිවිල් ඉංජිනේරුමය කාර්යයන් සඳහා මහා මාර්ග දෙපාර්තමේන්තුව හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවද, යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම සඳහා "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ද, 1971.01.10 දින ස්ථාපනය කර ඇත.

එතැන් සිට විවිධ රජයේ ආයතන මෙහෙයවීම සඳහා අවශ්‍ය වූ යාන්ත්‍රික ඉංජිනේරුමය සහායක සේවාවන් සැපයීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ අත්තිකාරම් ගිණුම් ක්‍රමයක් යටතේ පවත්වාගෙන යනු ලැබේ. කාලානුරූපීව රජයේ කර්මාන්තශාලා

දෙපාර්තමේන්තුව ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් හා පොදු පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය, නිවාස, ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය, සහ වර්තමානයේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ වන විට ශ්‍රී ලංකාව තුළ ජල කළමනාකරණ දොරටු නිර්මාණය කර සවි කිරීමේ වෙළඳපොල ප්‍රමුඛස්ථානය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත හිමිව තිබේ. මෑතකදී වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් නිම කරන ලද බොහෝ මහා පරිමාණ ජල ව්‍යාපෘතිවල ජල පාලන දොරටු සියල්ලම නිර්මාණය කර සවි කරන ලද්දේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසිනි. වෙහෙරගල, දැදුරු ඔය, ජේ ආරු සහ රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතීන් මින් කිහිපයකි.

රජයේ කර්මාන්තශාලාව විසින් යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ කරනු ලබන නිෂ්පාදන සහ සේවා ඉටු කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ කළවැඩ අත්තිකාරම් සහ ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය යටතේ වන බැවින් මෙම දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ වාණිජ කටයුතු මෙහෙයවන සුවිශේෂී දෙපාර්තමේනතුවක් වශයෙන් හැඳින්විය හැක. නිෂ්පාදන සහ නඩත්තු කාර්යයන් සඳහා යොදවනු ලබන දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ සහ සේවක පිරිස් සඳහා වැටුප් ගෙවීමට මාසිකව රුපියල් මිලියන 15 ක මුදලක් පාරිභෝගිකයින්ගෙන් උපයා ගත යුතුවේ. මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් සපයනු නොලැබේ.

ශ්‍රී ලංකා ජාතික තත්ත්ව ප්‍රතිපත්තිය අනුව යමින් 2013 වර්ෂයේදී රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව ISO 9001:2008 ජාත්‍යන්තර තත්ත්ව පද්ධති සහතිකය දිනා ගැනීමට සමත් විය. මෙම සහතිකය උපයා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග තුලින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට හැකි වූ අතර අප පාරිභෝගික සේවාවල වර්ධනයක් ද ඇති කිරීමට හැකි විය.

## 2. දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර

### දැක්ම

"බාහිර සහ අභ්‍යන්තර පාරිභෝගික සේවාවන් ගෝලීය ප්‍රවණතාවයන්ට ගැලපෙන පරිදි ගුණාත්මක භාවයෙන් ඉහළ තත්ත්වයට වර්ධනය කිරීම"

### මෙහෙවර

"යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩ, නිෂ්පාදන, උපදේශන සේවා සහ ආධුනිකයින්, ශිල්පීන්, තාක්ෂණ ශිල්පීන්, උපාධි අපේක්ෂක ආධුනිකයින් හා යාන්ත්‍රික ඉංජිනේරුවරුන් සඳහා කර්මාන්තශාලා වැඩහල නිෂ්පාදන සහ වැඩ සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා දීම යනාදී වැඩ සහ සේවාවන් සැපයීම"

## 3. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

### නිෂ්පාදන ක්ෂේත්‍රය

රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සඳහා ලෝහ සහ දැව භාණ්ඩ නිෂ්පාදනය

1. වාරිමාර්ග ජල කළමනාකරණ උපකරණ, ආරෝග්‍යශාලා උපකරණ නිෂ්පාදනය
2. කාර්යාල, අධ්‍යාපන සහ අධිකරණ සඳහා දැව භාණ්ඩ නිෂ්පාදනය
3. මහා මාර්ග සහ අනෙකුත් ඉදිකිරීම් සඳහා විවිධ වාත්තු නිෂ්පාදන සහ යන්ත්‍ර උපකරණ සහ උපාංග නිපදවීම
4. පොලිස් දෙපාර්තමේන්තුව සඳහා නිල පටි,තරු,අංක තහඩු නිෂ්පාදනය කිරීම
5. තැපැල් දෙපාර්තමේන්තුව සඳහා දින කැට හා වර්ෂ කැට නිෂ්පාදනය

### ඉදිකිරීම් ක්ෂේත්‍රය (බර වැද්දුම්)

1. වාරිමාර්ග සොරොව් සහ ජලාශ සඳහා විවිධ වර්ග වල දොරටු සහ උපාංග නිර්මාණය, නිෂ්පාදනය සහ සවි කිරීම ඓතිහාසික වශයෙන් වැදගත් විහාරස්ථාන සහ බුද්ධ ප්‍රතිමා සඳහා ආරක්ෂක වැටවල් සහ ආරක්ෂක වහල ඉදිකිරීම
2. ගොඩනැගිලිවල දැව සහ ලෝහ වහල ඉදිකිරීම
3. රාජ්‍ය උත්සව සඳහා සහභාගී වන විශේෂ ආරාධිත අමුත්තන් සඳහා විශේෂ ආවරණ, වේදිකා, කුටි සෑදීම සහ සකස් කිරීම
4. විදේශයන්හි සිට පැමිණෙන රාජ්‍ය නායකයන් සහ අමුත්තන් පිලිගැනීම සඳහා පිලිගැනීමේ පෙළ ඉදිකිරීම.

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

### අලුත්වැඩියා සහ නඩත්තු ක්ෂේත්‍රය

1. ආරෝග්‍යශාලා සහ ආයුර්වේද ආයතනවල යන්ත්‍ර උපකරණ අලුත්වැඩියාව
2. බන්ධනාගාරවල යන්ත්‍ර උපකරණ අලුත්වැඩියාව
3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජල කළමනාකරණ සොරොව්වල හා ජලාශවල දොරටු සහ උපාංග අලුත්වැඩියාව
4. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ කාර්යාලවල සහ ක්ෂේත්‍රයේ දැව භාණ්ඩ අලුත්වැඩියාව සහ ඔප දැමීම


### යාන්ත්‍රික ඉංජිනේරුසේවා

1. ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්,විවිධ පුහුණු ආයතනවල ආධුනිකයින් සඳහා පුහුණුව ලබා දීම.
2. රාජ්‍ය ආයතනවල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වාර්තා ලබා දීම.
3. රාජ්‍ය ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටුවල තාක්ෂණික ක්ෂේත්‍රය සඳහා සාමාජිකයින් ලෙස සහභාගී වීම.

## 3.1 තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන්

- ආරෝග්‍යශාලා ගෘහ උපකරණ හා මෙවලම් නිෂ්පාදනය
- ජල කළමනාකරණය සඳහා වන වාත්තු යකඩමය නිෂ්පාදන අරිය දොරටු, දව්ගුලු දොරටු හා පත් දොරටු
- වාත්තු යකඩමය නිෂ්පාදනයන් (මැන්හෝල් සැකිලි හා පියන් - ජල කළමනාකරණ උපකරණ)
- ලී භාණ්ඩ හා අනෙකුත් ලී නිෂ්පාදිතයන්
- මාර්ග බාධක හා සංඥා පුවරු
- යාන්ත්‍රික සයිරන් නලා, වර්ෂ, මාස හා දින කොටස් ඇතුළත් තැපැල් මුද්‍රා
- ස්ක්‍රීන් මුද්‍රණ, ඩිජිටල් මුද්‍රණ, දැන්වීම් පුවරු, කැටයම් වැඩ සහ ඒ හා බැඳුනු සේවාවන් සහ එම්බොස් (ඉලිප්පුම්වැඩ)
- පවුඩර් කෝටින් සහ යාන්ත්‍රික පින්තාරු වැඩ
- සියලු ආකාරයේ පාටිෂන් වෙන් කිරීම් වැඩ, ඇලුමිනියම් දොරවල් හා ජනෙල් නිෂ්පාදනය
- බිත්ති පනේල (කැටයම්) කිරීම
- කැපීම, සිදුරු කිරීම, එතීම, හිල් විදීම (ඩ්‍රිල් කිරීම) වැල්ඩින් වැඩ සහ කම්මල් වැඩ
- විශාල පිරිසැකසුම් වැඩ , සැහැල්ලු පිරිසැකසුම් වැඩ හා කම්මල් වැඩ
- යන්ත්‍රෝපකරණ සවි කිරීම
- යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කටයුතු හා සේවා සැපයීම් කටයුතු
- විදුලි යාන්ත්‍රික වැඩ
- විදුලි ස්ථාපනයන් හා අලුත්වැඩියාවන්
- ඉලෙක්ට්‍රෝ ප්ලේටින් ( විද්‍යුත් ලෝහාලේපනය)
- වරලත් යාන්ත්‍රික ඉංජිනේරු අපේක්ෂකයින් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම
- ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, සහ විවිධ පුහුණු ආයතනවල ආධුනිකයින් සඳහා පුහුණුව ලබාදීම සිදු කරනු ලබයි.

## 4. දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




ජේ.යා.අ -ජොයෂ්ඨ යාන්ත්‍රික අධිකාරී
ප්‍ර. සැශි - ප්‍රධාන සැලසුම් ශිල්පී
සංව. නිල - සංවර්ධන නිලධාරී
යා.අධි - යාන්ත්‍රික අධිකාරී
ප්‍ර.සමී.සහ - ප්‍රමාණ සමීක්ෂණ සහකාර
රා.ක.ස. - රාජ්‍ය කළමණාකරණ සහකාර
කා.කා.ස - කාර්යාල කාර්ය සහායක

වැඩ.පරි - වැඩ පරිපාලක
ප්‍ර.ක.ගලිපි - ප්‍රධාන කාළගණක ලිපිකරු
කා.ග.ලිපි - කාළගණක ලිපිකරු
වැඩ.ලිපි - වැඩහල ලිපිකරු
අර්.ශිල්පී- අර්ධ ශිල්පී
වැහ.සහ - වැඩහල සහකාර

තො.ස.තා.ස- තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර
ජේ.යා.අ.සැ - ජේෂ්ඨ යාන්ත්‍රික අධිකාරී සැපයුම්
ජේ.යා.අ.ආ - ජේෂ්ඨ යාන්ත්‍රික අධිකාරී ආරක්ෂක
පා.නි - පාලන නිලධාරී
අ.වැ.ස - අයවැය සහකාර
සු.සා.නි - සුභසාධක නිලධාරී
තො.ස.තා.නි- තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී

## 5. අනුමත කාර්යය මණ්ඩලය, පුරප්පාඩු හා අතිරික්ත

| විස්තරය / තනතුර හා මට්ටම | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සේවයේ යෙදී ඇති සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | ස්ථිර | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලං.ඉ.සේ. | 1 | 1 | 0 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී ලං.ඉ.සේ. | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ | ශ්‍රී ලං.ඉ.සේ. | 3 | 3 | 0 |
| ප්‍රධාන ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 5 | 0 | 5 |
| අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලං.ප.සේ. | 1 | 0 | 1 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ල.ග.සේ. | 1 | 1 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං.ග.සේ. | 1 | 0 | 1 |
| නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලං.ප.සේ. | 1 | 1 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලං.තො.හා සන්.තා.සේ. | 1 | 0 | 1 |
| යාන්ත්‍රික ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 11 | 11 | 0 |
| විදුලි ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 1 | 0 | 1 |
| සිවිල් ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 1 | 0 | 1 |
| ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. | 2 | 2 | 0 |
| නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | 1 | 0 | 1 |
| **ජ්‍යෙෂ්ඨ මට්ටමේ එකතුව** | | **31** | **20** | **11** |
| **තෘතියික මට්ටම** | | | | |
| පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. | 1 | 1 | 0 |
| ප්‍රධාන සැලසුම් ශිල්පී | ශ්‍රී ලං.තා.සේ. | 1 | 0 | 1 |
| ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී | ශ්‍රී ලං.තා.සේ. | 7 | 2 | 5 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී ලං.තො.හා සන්.තා. සේ. | 1 | 0 | 1 |
| **තෘතියික මට්ටමේ එකතුව** | | 10 | 3 | 7 |

<table>
<tr><td colspan="6">ද්විතියික මට්ටම</td></tr>
<tr><td>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර</td><td>ශ්‍රී ලං.තො.හා සන්.තා. සේ.</td><td>6</td><td colspan="2">0</td><td>6</td></tr>
<tr><td>සංවර්ධන නිලධාරී</td><td>සංවර්ධන නිලධාරී සේවය</td><td>15</td><td colspan="2">9</td><td>6</td></tr>
<tr><td>නීති සහකාර</td><td>ආශ්‍රිත නිලධාරී</td><td>1</td><td colspan="2">1</td><td>0</td></tr>
<tr><td>සැලසුම් ශිල්පී</td><td>ශ්‍රී ලං.තා.සේ.</td><td>5</td><td colspan="2">3</td><td>2</td></tr>
<tr><td>යාන්ත්‍රික අධිකාරී</td><td>ශ්‍රී ලං.තා.සේ.</td><td>25</td><td colspan="2">14</td><td>11</td></tr>
<tr><td>විදුලි අධිකාරී</td><td>ශ්‍රී ල.තා.සේ.</td><td>1</td><td colspan="2">0</td><td>1</td></tr>
<tr><td>සිවිල් අධිකාරී</td><td>ශ්‍රී ලං.තා.සේ.</td><td>1</td><td colspan="2">0</td><td>1</td></tr>
<tr><td>ප්‍රමාණ සමීක්ෂණ සහකාර</td><td>දෙපාර්තමේන්තුගත</td><td>2</td><td colspan="2">0</td><td>2</td></tr>
<tr><td>පරිගණක රූ රටා නිර්මාණ ශිල්පී</td><td>ශ්රී ලං.තො.හා සන්.තා.සේ.</td><td>1</td><td colspan="2">0</td><td>1</td></tr>
<tr><td>රාජ්‍ය කළමනාකරණ සහකාර</td><td>රා.ක.ස.සේ.</td><td>60</td><td colspan="2">37</td><td>23</td></tr>
<tr><td>වැඩහල් පරිපාලක</td><td>දෙපාර්තමේන්තුගත</td><td>35</td><td colspan="2">24</td><td>11</td></tr>
<tr><td>වැඩහල් සහකාර</td><td>දෙපාර්තමේන්තුගත</td><td>21</td><td colspan="2">13</td><td>8</td></tr>
<tr><td>වැඩහල් ලිපිකරු</td><td>දෙපාර්තමේන්තුගත</td><td>12</td><td colspan="2">7</td><td>5</td></tr>
<tr><td>කාලගණක ලිපිකරු</td><td>දෙපාර්තමේන්තුගත</td><td>12</td><td colspan="2">7</td><td>5</td></tr>
<tr><td colspan="2">ද්විතියික මට්ටමේ එකතුව</td><td>197</td><td colspan="2">115</td><td>82</td></tr>
<tr><td colspan="6">ප්‍රාථමික මට්ටම</td></tr>
<tr><td>රියදුරු</td><td>ඒකාබද්ධ රියදුරු සේවය</td><td>25</td><td colspan="2">14</td><td>11</td></tr>
<tr><td>කාර්යාල කාර්ය සහායක</td><td>කාර්යාල සේවක සේවය</td><td>16</td><td colspan="2">6</td><td>10</td></tr>
<tr><td>සනීපාරක්ෂක කම්කරු</td><td>දෙපාර්තමේන්තුගත</td><td>6</td><td colspan="2">6</td><td>0</td></tr>
<tr><td>කම්කරු ශිල්පීය (1-1 පන්තිය)</td><td>දෙපාර්තමේන්තුගත</td><td>254</td><td colspan="2">135</td><td>119</td></tr>
<tr><td>කම්කරු ශිල්පීය (1-11 පන්තිය)</td><td>දෙපාර්තමේන්තුගත</td><td rowspan="2">157</td><td>68</td><td rowspan="2">99</td><td rowspan="2">58</td></tr>
<tr><td>කම්කරු අර්ධ ශිල්පීය (11 පන්තිය)</td><td>දෙපාර්තමේන්තුගත</td><td>31</td></tr>
<tr><td>කම්කරු ශිල්පීය  නොවන</td><td>දෙපාර්තමේන්තුගත</td><td>94</td><td colspan="2">61</td><td>33</td></tr>
<tr><td colspan="2">ප්‍රාථමික මට්ටමේ එකතුව</td><td>552</td><td colspan="2">321</td><td>231</td></tr>
<tr><td colspan="2">මුළු එකතුව</td><td>790</td><td colspan="2">459</td><td>331</td></tr>
</table>

# 6. 2016 අයවැය ඇස්තමේන්තුව

## ශීර්ෂය - 310

**1** වන ව්‍යාපෘතිය - සාමාන්‍ය පාලනය හා කාර්යය මණ්ඩල සේවාවන්
**2** වන ව්‍යාපෘතිය - නිපැයුම්,පිරිසැකසුම්,නඩත්තු හා අලුත්වැඩියා සේවාවන්

| වියදම් | ඇස්තමේන්තු වටිනාකම රු.මි. | වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | **90.635** | **76.966** | **13.669** |
| මූලධන වියදම් | **51.690** | **51.375** | **0.315** |
| මුළු එකතුව | **142.325** | **128.341** | **13.984** |

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම

| විස්තරය | ඇස්තමේන්තුව (රු.මි) | සත්‍ය (රු.මි) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | **27** | **30.533*** |
| අවම බැර සීමාව | **21** | **29.835** |
| උපරිම හර ශේෂ සීමාව | **120** | **82.097** |

සටහන් :-

* තථ්‍ය අගය තුල හරස් සටහන් මගින් ණය ශේෂ නිරවුල් කිරීම් රු.මි.**1.197**ක් හා වැරදි නිවැරදි කිරීම් රු.මි. **3.229**ක් ඇතුලත් වේ.අදාල හරස් සටහන් මගින් ණය ශේෂ නිරවුල් කිරීම් හා වැරදි නිවැරදි කිරීම් නොමැති නම් තථ්‍ය අගය රු.මි.**26.106**ක් වේ.

ගබඩා අත්තිකාරම් ගිණුම


| විස්තරය | ඇස්තමේන්තුව (රු.මි) | සත්‍ය (රු.මි) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | **80** | **87.664 *** |
| අවම බැර සීමාව | **80** | **113.805 *** |
| උපරිම හර ශේෂ සීමාව | **65** | **33.848** |

<u>සටහන්</u> :-

*** 2017/05/12** දින දරණ පාර්ලිමේන්තු මහ ලේකම්ගේ අත්සනින් යුතුව නිකුත් කළ ලිපිය මගින් සංශෝධිත ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලැබී ඇත.

## 7. දෙපාර්තමේන්තුවේ අංශ සහ ව්‍යුහය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යංශය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා දෙපාර්තමේන්තු ප්‍රධානියා වේ. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු අනුමත කාර්ය මණ්ඩලය 790 කි. දැනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව 459 කි. පුරප්පාඩු සංඛ්‍යාව 331 කි.



## 7. 1 පාලන අංශය

**ප්‍රධාන කාර්යයන්**

1) ආයතන සංග්‍රහය,කලින් කලට නිකුත් වන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ සහ රාජ්‍ය සේවා කොමිසමේ නියෝග අනුගමනය කරමින් දෙපාර්තමේන්තුවේ සේවය කරන සියලුම නිලධාරීන්ගේ මානව සම්පත් කළමනාකරණය.

2) දීප ව්‍යාප්ත සේවා, ඒකාබද්ධ සේවා, යටතේ වන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සම්බන්ධ උසස් කිරීම්, විනය,මාරු වීම් සහ නිවාඩු ආදී වාර්තා, පත් කිරීම් බලධාරී වෙත ඉදිරිපත් කිරීම.

3) දෙපාර්තමේන්තුගත සේවාවන් සඳහා විධිමත් බඳවා ගැනීම් පටිපාටි සකස් කර/යාවත්කාලීන කර රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලබා ගැනීම.එම නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, අභ්‍යන්තර මාරු කිරීම් සහ විනය පාලන කටයුතු ආදිය.

## 7.2 වැඩ අංශය

වැඩ අංශය විසින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන හා සේවා සපයනු ලැබේ. මෙම අංශය මගින් දෙපාර්තමේන්තුගත කාර්යය මණ්ඩලයේ වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ආදායම් උපදවා ගැනීම සහ දෙපාර්තමේන්තුවේ අරමුණු සඵල කර ගැනීම සඳහා බාහිර පාර්ශවයන් සමග කටයුතු කළ යුතු වේ.

රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි තරඟකාරී මිල කැඳවීම ටෙන්ඩර් මගින් ලබා ගන්නා හෝ විමසීම් මගින් ඇණවුම් කරනු ලබන සියලුම යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ඉටු කිරීම ප්‍රධාන කාර්යය වේ.

අධ්‍යක්ෂ (වැඩ) යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. මෙම අංශය තුල නිෂ්පාදන වැඩහල් 05 ක් සහ සේවා වැඩහල් 02 ක් ක්‍රියාත්මක වේ. සේවක මණ්ඩලය යාන්ත්‍රික ඉංජිනේරුවරුන්, යාන්ත්‍රික අධිකාරිවරුන්, වැඩහල් පරිපාලකවරුන්, කළමනාකරණ සහකාරවරුන්, වැඩහල් සහකාර, වැඩහල් ලිපිකරු, සහ පුහුණු/නුපුහුණු ශිල්පීන්ගෙන් සමන්විත වේ.

- **වැඩ අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්**
  - ♦ බර වැද්දුම් කාර්යයන් සහ නිෂ්පාදන
  - ♦ අලුත්වැඩියා සහ නවීකරණ කටයුතු
  - ♦ දැව නිෂ්පාදන සහ කාර්යයන්
  - ♦ ඉංජිනේරු සේවාවන්

### 7.2.1 බර වැද්දුම් කාර්යයන් සහ නිෂ්පාදන

බර වැද්දුම් කාර්යයන් සහ නිෂ්පාදන යටතේ රජයේ කර්මාන්තශාලාව මගින් ඉටු කරන ප්‍රධාන වැඩ වශයෙන් හඳුනා ගත හැක්කේ ජල කළමනාකරණ සඳහා වාරි මාර්ග දෙපාර්තමේන්තුව මගින් ඇණවුම් කරන අරීය දොරටු, නැවතීමේ ලොග් දොරටු, ජ්ලැප් දොරටු සහ අනෙකුත් වර්ගවල ජල දොරටු නිර්මාණය කිරීම, පිරිසැකසීම, සවි කිරීම සහ අලුත්වැඩියා කිරීමයි.

මෙම දොරටු වර්ග සහ උපාංග නිපදවීම සඳහා ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි යකඩ වානේ වර්ග, සුදු යකඩ, වීනච්චට්ටි සහ දැව යනාදී අමුද්‍රව්‍ය යොදා ගනී. වර්තමානයේ රජයේ කර්මාන්තශාලාවට ලැබෙන වැඩ වලින් 70% ක් පමණ මෙම ජල කළමනාකරණ දොරටු සම්බන්ධ වැඩ සහ නිෂ්පාදන කටයුතු වේ.

මෙම ජල කළමනාකරණ දොරටු සහ උපාංග නිපදවීමේ ක්‍රියාවලියට අදාල සියලුම යන්ත්‍ර, උපකරණ සහ ආයුධ, රජයේ කර්මාන්තශාලාවේ වැඩහලට අයත් වන අතර එමගින් ලෝහ වැඩ කිරීම, කැපීම, විදීම, යන්ත්‍රණය කිරීම, පෑස්සුම් කිරීම(ටිග් මිග් ඇතුලුව) ගෑස් වලින් කැපීම, සැන්ඩ් බ්ලාස්ටින් කිරීම, ස්ප්‍රේ තීන්ත ආලේපන කිරීම යනාදි ක්‍රියාකාරකම් කළ හැකිය. ගැල්වනයිස් ආලේප කිරීම පමණක් ප්‍රමිතියෙන් උසස් පිළිගත් ආයතනයන් මගින් කර ගනු ලැබේ.මෙසේ නිපදවන භාණ්ඩ හා වැඩවල පෑස්සුම් තත්ත්ව පරීක්ෂාවට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් නිර්දේශිත පළපුරුදු සුදුසුකම්ලත් පරීක්ෂකවරුන් යොදවා ගනු ලැබේ.

- ♦ බර පිරිසැකසීමේ අංශය මඟින් ගොඩනැගිලිවල වහලය අලුතින් පිරිසකසා සවි කිරීම සහ අලුත්වැඩියා කර සවිකිරීමටත්, ගලවා ඉවත් කිරීමටත් කටයුතු කරනු ලැබේ.
- ♦ රාජ්‍ය උත්සව සඳහා සහභාගී වන විශේෂ ආරාධිත අමුත්තන් සඳහා විශේෂ ආවරණ, වේදිකා, කුටි සෑදීම සහ සවිකිරීම
- ♦ විදේශයන්හි සිට පැමිණෙන විශේෂ අමුත්තන් පිලිගැනීම සඳහා පිලිගැනීමේ පෙළ ඉදි කිරීම
- ♦ මීට අමතරව ආරෝග්‍ය ශාලා උපකරණ නිපදවීම, විද්‍යාගාර උපකරණ නිපදවීම, කාර්යාලීය උපකරණ නිපදවීම සිදු කරනු ලැබ

## 7.2.2 අලුත්වැඩියා සහ නවීකරණ කටයුතු

- ♦ ඓතිහාසික වශයෙන් වැදගත් විහාරස්ථාන සහ බුද්ධ ප්‍රතිමා සඳහා ආරක්ෂක වැටවල් සහ ආරක්ෂක වහල ඉදි කිරීම්.
- ♦ ගොඩනැගිලිවල වහල අලුත්වැඩියාවන්.
- ♦ ඡන්ද පෙට්ටි අලුත්වැඩියාවන්.
- ♦ පූජනීය ස්ථානවල ගේට්ටු පිරි සැකසීම සහ සවි කිරීම.
- ♦ පිත්තල සහ වීනච්චට්ටි වලින් රජයේ ආයතන සහ විහාරස්ථාන සඳහා විසිතුරු වැට ඉදි කිරීම.
- ♦ ගේට්ටු වැටවල් අලුත්වැඩියා කිරීම
- ♦ ආරක්ෂක මුර කුටි සෑදීම සහ සවි කිරීම
- ♦ දැව භාණ්ඩ ඔප දැමීම
- ♦ තාර බොයිලේරු, තාර යොදන උපකරණ හා අදාල උපාංග සෑදීම
- ♦ මාර්ග සංඥා පුවරු සෑදීම

## 7.2.3 දැව නිෂ්පාදන සහ කාර්යයන්

- ♦ ඡන්ද පෙට්ටි සෑදීම
- ♦ කාර්යාල උපකරණ සෑදීම
- ♦ අධිකරණ අමාත්‍යාංශය සඳහා උසාවි ගෘහ භාණ්ඩ සෑදීම
- ♦ ගෘහ භාණ්ඩ සෑදීම
- ♦ දැවමය ජල දොරටු සෑදීම
- ♦ ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ ඔප දැමීම.

## 7.2.4 ඉංජිනේරු සේවාවන්

- ♦ ඉංජිනේරු උපාධි අපේක්ෂකයින් සහ විවිධ පුහුණු ආයතන වල ආධුනිකයන් සඳහා පුහුණුව ලබා දීම.
- ♦ රාජ්‍ය ආයතනවල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා වාර්තා ලබා දිම.
- ♦ තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා සාමාජිකයන් ලබා දීම.

## 7.3 අලෙවි පර්යේෂණ සහ සංවර්ධන අංශය

ප්‍රවර්ධන කටයුතු මගින් නිෂ්පාදන තත්ත්වය වැඩි දියුණු කිරීම සහ නව නිෂ්පාදන වලට යොමු කිරීම හා ප්‍රචාරණ කටයුතු තුළින් දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන අලෙවිය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙම අංශය මගින් සිදු කරයි. අලෙවි, පර්යේෂණ, සහ සංවර්ධන අධ්‍යක්ෂ යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. අලෙවි, ඇස්තමේන්තු, පර්යේෂණ, සහ සැලසුම් සහ නිර්මාණ ඒකක මෙම අංශය යටතේ පවතී.

### ප්‍රධාන කාර්යයන්

i. ජලාශවල දිය දොරටු අවශ්‍ය පරිදි පාරිභෝගික අවශ්‍යතාවය අනුව නිර්මාණය කිරීම.

ii. පාරිභෝගික අවශ්‍යතාවය අනුව නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා වල ඇස්තමේන්තු සකස් කර බාහිර ආයතන වලට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම.

iii. බාහිර සහ අභ්‍යන්තර පාරිභෝගික අවශ්‍යතාවය අනුව සපයනු ලබන සේවා සහ නිෂ්පාදන සඳහා ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කිරීම.

iv. සම්මත නිෂ්පාදන සහ සේවාවන් වල ඇස්තමේන්තු වසර ආරම්භයේ දී සකස් කර පාරිභෝගිකයින් වෙත යොමු කිරීම.

v. පාරිභෝගිකයින්ගේ අදාල ඉල්ලීම් වලට ක්ෂණික ප්‍රතිචාර දැක්වීම. (E-mail, Fax හා දුරකතන මගින්)

vi. දැනට සිටින කාර්ය මණ්ඩලය භාවිතා කරමින් අවශ්‍යතාවය අනුව ප්‍රමාදයකින් තොරව ඇස්තමේන්තු සාදා සැපයීම.

## 7. 4 කාර්ය සම්පාදන අංශය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්ය සම්පාදන අංශය සමන්විත වනුයේ පහත දක්වා ඇති ඒකක වලිනි.

- සැපයුම් ඒකකය
- තොරතුරු තාක්ෂණ ඒකකය
- ආරක්ෂක ඒකකය
- ප්‍රගති සහ පුහුණු ඒකකය

එම ඒකකවල කාර්යයභාරයන් පහත දැක්වේ.

### සැපයුම් ඒකකය

සැපයුම් ඒකකයේ කාර්යය භාරය වනුයේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් පිටත ආයතන වෙත ලබා දෙන නිෂ්පාදන සහ සේවාවන් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය සහ සේවාවන් කලට වේලාවට ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කිරීමයි.

සැපයුම් ඒකකය වෙත ලැබෙන දේශීය ඇණවුම්, ගබඩා ඇණවුම්, සහ මූලධන වියදම් ප්‍රසම්පාදන මට්ටම අනුව අදාල ප්‍රසම්පාදන කමිටුවට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යොමු කර ප්‍රසම්පාදන කාලසටහනකට අනුව කටයුතු කිරීම සඳහා මූලික සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රධාන වශයෙන් වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය සහ ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීම යටතේ මිළ ගණන් කැදවනු ලැබේ.

දළ වශයෙන් මාසිකව මිලියන 10 ක් පමණ ද්‍රව්‍ය, භාණ්ඩ, සහ සේවාවන් ප්‍රසම්පාදනය කරනු ලැබේ.

### තොරතුරු තාක්ෂණ ඒකකය

තොරතුරු තාක්ෂණ ඒකකයෙහි කාර්යය භාරය වනුයේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පරිගණක ජාලය නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීමයි. පරිගණක 150 ක් පමණ මෙම පරිගණක ජාලයට සම්බන්ධ කර ඇති අතර ප්‍රධාන වශයෙන් පරිගණක ජාලය තුලින් කරමාන්තශාලා කළමණාකරන මෘදුකාංගය ක්‍රියාත්මක කරනු ලැබේ.

### ආරක්ෂක ඒකකය

ආරක්ෂක ඒකකයෙහි කාර්යය භාරය වනුයේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දීම සහ පිටතට රුගෙන යන අමුද්‍රව්‍ය , නිෂ්පාදන භාණ්ඩ, සහ ආයුධ පරීක්ෂා කිරීම සහ නැවත රුගෙන ඒම සහතික කිරීම ය.

### පුහුණු සහ ප්‍රගති ඒකකය

පුහුණු ඒකකය මගින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ වැඩහල් සේවක මහතුන්, ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්, සහ විවිධ පුහුණු ආයතනවල ආධුනිකයින් සඳහා පුහුණුව ලබා දීම සිදු කරනු ලබයි.

## 7. 5 ගිණුම් අංශය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත වාර්ෂිකව අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන සම්බන්ධයෙන් හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන වාණිජ කටයුතු සම්බන්ධයෙන් වූ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ගණන් තැබීමේ කටයුතුවලට අදාල සියලුම කටයුතු සංවිධානය හා අධීක්ෂණය කිරීමත්, මුදල් හා බඩුබාහිරාදිය භාරව සිටීමත්, ඉහත කටයුතු සම්බන්ධයෙන් වූ මූල්‍ය වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමත් ගිණුම් අංශයේ කාර්යභාරය යි.

දෙපාර්තමේන්තුවේ වැඩහල් වල නිෂ්පාදන සහ පාරිභෝගික සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත් අවශ්‍ය අමු ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ප්‍රධාන ගබඩාව සහ දැව ගබඩාව පවත්වා ගෙන යනු ලැබේ.

## 8. 2016 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

### 8. 1 2016 වර්ෂයේ ඉටු කළ විශේෂ කාර්යයන්

### 8.1.1 පාලන අංශයේ ප්‍රගතිය

- රා.ප.ව 03/2016 අනුව සියලුම නිලධාරීන් එම වැටුප් ක්‍රමවල නිවැරදිව පිහිටුවීම.
- PL කාණ්ඩයට අයත් සේවකයින් MT වැටුප් ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුගත තනතුරු වන නීති නිලධාරී, නීති සහකාර, ප්‍රමාණ සමීක්ෂණ සහකාර, වැඩහල් පරිපාලක, වැඩහල් සහකාර, වැඩහල් ලිපිකරු, කාල ගණක ලිපිකරු, ප්‍රාථමික ශිල්පීය, අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු අනුමත කර ගැනීම.
- වැඩහල් ලිපිකරු/වැඩහල් සහකාර/කාල ගණක ලිපිකරු තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය MN1 වැටුප් කේතය යටතේ දැනට අනුමත කර ගැනීම.

### 8.1.2 වැඩ අංශයේ ප්‍රගතිය

**ජල කළමනාකරණ දොරටු සහ උපාංග පිරිසැකසීම සහ අලුත්වැඩියා කිරීම**

**පේ ආරු ව්‍යාපෘතිය**

වවුනියා දිස්ත්‍රික්කයේ පේ ආරු ඇල හරස් කර කියුබික් මීටර් මිලියන 3.82ක ධාරිතාවකින් යුත් ජලාශයක් ඉදි කර ඇත. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය මගින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය පානීය ජලය ලබා දීමට නියමිතය. මෙම ජලාශයට අවශ්‍ය අරිය දොරටු 03ක්, හදිසි දොරටු සෑදීම රජයේ කර්මාන්තශාලාව මගින් සිදු කළ අතර සවි කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු ප්‍රදේශයේ පවුල් 94,000කට පමණ පානීය ජලය ලබා ගැනීමට හැකි වනු ඇත.

**අලිකොට ආර ව්‍යාපෘතිය**

අරිය දොරටු 03ක් සොරොව් දොරටු 04ක් හා හදිසි දොරටු 04ක් ඉදිකිරීම හා සවි කිරීම.

ඉහත දොරටු, උමා ඔය ව්‍යාපෘතිය මගින් පිට වන ජලය භාවිතා කර ඉදි කිරීමට යෝජිත අලිකොට ආරු ජලාශයට සවි කිරීමට නියමිතය. දැනට අරිය දොරටු 03 හි එකලස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මි.110.0කි.

**දැදුරු ඔය ව්‍යාපෘතිය**

දැදුරු ඔය ව්‍යාපෘතිය මගින් ඉදි කිරීමට යෝජිත විදුලි බලාගාරයට අවශ්‍ය උපාංග සෑදීම.
මෙම විදුලි බලාගාරයට ජලය ඇතුලු කරන ගේට්ටු (Intake Gate) 03ක් සාදා සවිකර ඇති අතර ඒවායේ ඇති වන අලුත්වැඩියාවන් වලදී ජලය රඳවා ගැනීම සඳහා භාවිතා කරන ගේට්ටු (Stop log Gate)03 ක් ද සාදා ඇත.

ජලය සමග එන දැව කැබලි සුන්බුන් ආදිය රඳවා ගැනීම සඳහා ට්‍රෑෂ් රැක් (Trash Rack) 03ක්ද **සාදා සවිකර ඇත. ඇස්තමේන්තුගත මුදල රු.මි.38.20කි**

**හිමදූරාව ව්‍යාපෘතිය**

අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාවට අවශ්‍ය පානීය ජලය ලබා දීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය මගින් ක්‍රියාත්මක ඉහත ව්‍යාපෘතිය සඳහා ජල පාලන දොරටු 03ක් හා එසවුම් පද්ධතිය සාදා සවි කර ඇත. ඇස්තමේන්තුගත මුදල රු.මි.23.40කි.

**නාච්චදූව ව්‍යාපෘතිය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි නාච්චදූව ජලාශය සඳහා වීනච්චට්ටි ලෝහයෙන් සාදන ලද දොරටු 2ක් හා හදිසි දොරටු 2ක් සවි කර ඇත. ඇස්තමේන්තුගත මුදල රු.මි.20.50කි.

**විශේෂ සේවාවන්**

- ජාතික නිදහස් දින උළෙලේ ආචාර පීඨිකාව හා විශේෂ අමුත්තන් සඳහා වන කුටිය සූදානම් කිරීම, විදේශීය රාජ්‍ය නායකයින් හා විදේශීය නිලධාරීන් පිළිගැනීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ පීඨිකාව ඉදි කිරීම.

- ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ වියළි කලාපයේ මතුපිට ජල සම්පත් දියුණු කිරීමේ සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් වවුනියා දිස්ත්‍රික්කයේ අලුතින් ඉදි කරන ලද පේ ආරු ජලාශයේ ජල පාලන අරිය දොරටු 03ක් සහ උපාංග නිර්මාණය කර පිරි සකසා සාදා සවි කිරීමේ උප කොන්ත්‍රාත්තුව නිම කරන ලදී ; කොන්ත්‍රාත්කරු - BMG/KDAW ඒකාබද්ධ ව්‍යාපාරය.

- ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ අවුකන සහ මාළිගාවිල බුද්ධ ප්‍රතිමාවල දීර්ග කාලීන පැවැත්ම සහ ආරක්ෂාව සඳහා ආවරණ වහල ඉදි කිරීම අවසන් කරන ලදී



ඉලුක් අමුණ ව්‍යාපෘතිය - අරිය දොරටු 03ක් එසවීම් පද්ධතියක් සමග සාදා සවි කිරීම



දැදුරු ඔය ව්‍යාපෘතිය අරිය දොරටු 08ක් සඳහා එසවීම් පද්ධතියක් සාදා සවි කිරීම (පළමු සැලසුමට අනුව)



අවුකන බුද්ධ ප්‍රතිමාව සඳහා ආවරණ වහල ඉදිකිරීම



මාලිගාවිල බුද්ධ ප්‍රතිමාව සඳහා ආවරණ වහල ඉදිකිරීම

ආවරණ වහල ඉදිකිරීම



පේ ආරු ව්‍යාපෘතිය - අරිය දොරටු 03ක් හා අනෙකුත් උපාංග සවි කිරීම



අලිකොට ආරු ව්‍යාපෘතිය - සොරොව් දොරටු 04ක්, හදිසි දොරටු 04ක් හා අරිය දොරටු 03ක් සාදා සවි කිරීම

## 8. 1.3 අලෙවි, පර්යේෂණ, සහ සංවර්ධන අංශයේ ප්‍රගතිය

- තොන්ඩමනාරු කලපුවේ ජල පාලන දොරටු 18ක් නිර්මාණය කිරීම.
- තොන්ඩමනාරු කලපුවේ ජල දොරටු හා රාජාංගනය ජල දොරටු අලුතින් නිර්මාණය කර ඉදි කරමින් පවතී.මොරාණ ජලාශ ව්‍යාපෘතිය, කුඩා ඔය ජලාශය ආදී ජලාශ සඳහා ද නව දොරටු නිර්මාණය කර ඇත.
- රජයේ ඇණවුම් මෙන්ම විදේශාධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා තරඟකාරී ලෙස ටෙන්ඩර් කැඳවන අවස්ථා වලදී ඒ සඳහා ඉදිරිපත් වීම.

  නිදසුන් - රාජාංගනය ජලාශයේ දිය දොරටු අලුතින් සාදා සවි කිරීම,මොරාන ජලාශයේ ප්‍රධාන ඇළ මාර්ගය දොරටු සාදා සවි කිරීම සඳහා අදාල තරඟකාරි මිල ගණන් ඉදිරිපත් කර එම කාර්යයන් ලබා ගැනීම.
- ව්‍යාපෘති කටයුතු වලට අවශ්‍ය විවිධ වැඩහල් වල කාර්යයන් වෙනුවෙන් ඇස්තමේන්තු 292 ක් සාදා සපයා ඇත.
- රෝහල් ඇඳන් සහ නවීකරණය කිරීම, එම්බොසින් යන්ත්‍රය ස්වයංක්‍රීයව ක්‍රියා කරවීමට සකස් කිරීම.
- භාණ්ඩ හා සේවා වල විස්තර ඇතුළත් පත්‍රිකා හා මිල ගණන් ආයතන වලට යැවීම.
- ව්‍යාපෘති සහ නිෂ්පාදන වල විස්තර ඇතුලත් අත්පොතක් සකස් කිරීම.

## 8.1.4 කාර්ය සම්පාදන අංශයේ ප්‍රගතිය

- ප්‍රදර්ශන වලට සහභාගී වීම
- සැපයුම් ඒකකය වෙත 2016 වර්ෂයේදී දේශීය ඇණවුම් 868ක්ද, ගබඩා ඇණවුම් 156ක්ද, මූලධන වියදම් 69ක්ද, ලැබී ඇත. මෙම ඇණවුම්වල ප්‍රගතිය පිළිවෙලින් 66%, 65% සහ 76%ක් වේ.ප්‍රසම්පාදන වටිනාකම මිලියන 102කි.
- තොරතුරු තාක්ෂණ ඒකකය විසින් පරිගණක ජාලය හා එයට සම්බන්ධ පරිගණකවල සියලුම නඩත්තු කටයුතු සම්පූර්ණ කරන ලද අතර පරිගණක ජාලය වැඩහල් හා ගබඩා දක්වා ව්‍යාප්ත කරන ලදී.
- ආරක්ෂක ඒකකය විසින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ දේපළ හා පුද්ගල ආරක්ෂාව තහවුරු කර තිබේ.
- පුහුණු ඒකකය විසින් සේවක මහතුන් පුහුණු කිරීමේ ඉලක්ක සපුරා ඇත. 80%ක ප්‍රගතියක් ලබා ඇත.

## 8.1.5 ගිණුම් අංශයේ ප්‍රගතිය

**කළ වැඩ අත්තිකාරම් ගිණුම**

2016 වර්ෂය සඳහා වන පිරිවැටුම රු. 320,419,056.00ක් වන අතර ශුද්ධ ලාභය රු. 9,597,677.00ක් වූ අතර මෙය පිරිවැටුමෙන් 3%ක් පමණ විය.

**ගබඩා අත්තිකාරම් ගිණුම**

2016 වර්ෂය තුල දී සැපයීම් හි වටිනාකම රු.91,942,550.92ක් වූ අතර මූ.රෙ.501(අ) ප්‍රකාරව ගබඩා අත්තිකාරම් පාඩු අපේක්ෂා නොකරනු ලබන්නා සේම ලාභ අපේක්ෂාවෙන් ද කටයුතු නොකෙරේ.

# 9. අභියෝග හා අනෙකුත් බාධාවන්

- විදේශාධාර යටතේ ක්‍රියාත්මක වන මහා පරිමාණ ව්‍යාපෘතීන් සඳහා රජයේ ආයතන වලට තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදීම සහ එම කාර්යයන් පෞද්ගලික ආයතන හරහා ලබා ගැනීමට සිදු වීම.

- වෙළඳපොලෙහි පවතින ප්‍රමිතියෙන් අඩු සහ මිල අඩු භාණ්ඩ සමග තරඟ කිරීමට අපහසු වීමත් පෞද්ගලික ආයතන මගින් අනුගමනය කරන උපක්‍රම හා අනෙකුත් අලෙවි ක්‍රම අනුගමනය කිරීමට නොහැකි වීම.

- යාන්ත්‍රික ඉංජිනේරුමය නිෂ්පාදන සහ සේවාවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සහ උපාංග වෙළඳපොල තුළ බහුලව නොතිබීම නිසා නිෂ්පාදනය කර ලබා ගැනීමට සිදු වීම හා බොහෝ විට විදේශයන් මගින් ආනයනය කර සපයා ගැනීමට සිදු වන බැවින් උපාංග සහ අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ප්‍රමාදයන් සිදු වීම හා සමහර උපාංග ප්‍රායෝගිකව සැලසුම් කර ඇණවුම් කිරීමට නොහැකි වීම නිසාත් සිදු වන ප්‍රමාදයන් (සමහර අවස්ථාවලදී සාම්පල් ඉදිරිපත් කිරීමට සිදු වේ.)

- තාක්ෂණික හා කාර්යාලීය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු දිගින් දිගටම පැවතීම හා කලට වේලාවට පිරවීමේ යන්ත්‍රණයක් නොතිබීම.

- නව තාක්ෂණය සහිත යන්ත්‍රසූත්‍ර ලබා ගැනීම තුලින් කාර්යක්ෂමතාවය හා නිෂ්පාදනය ඉහල නැංවීම. මේ සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත.

- ආයතනික සම්පත් සැලසුම් කිරීමේ (ERP)මෘදුකාංගයක් ස්ථාපනය කර පරිපාලන කාර්යයන් කාර්යක්ෂම කිරීම.

- 2018 වර්ෂයේදී ISO 9001: 2008 අවභාවිත වන අතර ISO 9001: 2015 ලබා ගත යුතු අතර ඒ සඳහා දැනට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.
- යාන්ත්‍රික ඉංජිනේරු ඉදිකිරීම් සේවා සහ නිෂ්පාදන සඳහා වෙළඳපොල ප්‍රමිතියක් නොමැති වීම හා මේ පිළිබඳව සොයා බැලීමට නියාමක ආයතන නොමැති වීම.

- සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා රාජ්‍ය ආයතනවලින් ලැබීමට නියමිත මුදල් නියමිත කාල වකවානු තුල නොලැබීම.

## 10. 0 කාර්ය සාධනය ඉහල මට්ටමකට ගෙන ඒම සඳහා ගත යුතු පියවර

10.1 ආයතනික මට්ටමෙන් යහපත් මූල්‍ය පාලනය තුලින් වියදම් අඩු කර ගැනීමට කටයුතු කිරීම

10.2 2016.09.23 දින සිට ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත. ආයතනයේ සේවය කරන නිලධාරීන්ගේ උසස්වීම් නිසි කලට ලබා දීම තුලින් වඩා කාර්යක්ෂම සේවයක් ලබා ගත යුතුය. වැඩහල කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතාවය හා සේවා කාලය අනුව තාක්ෂණ සේවා මට්ටම් වලට අන්තර්ග්‍රහණය කිරීම තුළින් කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයට කාර්යය සාධනය වැඩි කර ගැනීමට සැලසුම් කිරීම.

10.3 ආයතනයේ වැඩ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපෘති යෝජනා සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වන අතර ආයතනික සම්පත් කළමනාකරණය සහ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දීමට සැලසුම් කළ යුතුය.

10.4 ISO 9001:2015 තත්ව පද්ධති සහතිකය දිනාගැනීම.